# අනතුරට පෙර ගුවන් හමුදාව පෙරහුරු තුනක් පැවැත්වූවා

දිගාමඬුල්ල විශේෂ - වසන්ත චන්ද්‍රපාල
සිරිපුර සමූහ - මධුෂානි අබේසිංහ සහ
ඇළහැර සමූහ - සරත් වෙලගෙදර



තුසිත වර්ණ


උදය කුමාර


ප්‍රේමරත්න


මෙත්රුවන්


පෙරේරා


දසනායක

මාදුරුඔය විශේෂ බළකා හමුදා කඳවුරේ පුහුණුව ලැබූ විශේෂ බළකා සෙබළුන් 116ක් සහ නිලධාරීන් 14 දෙනකුගේ විසිරයෑමේ උත්සවය ඉකුත් 09 වැනිදා පැවැත්වීමට කටයුතු සංවිධාන කර තිබිණි.

මෙහි ප්‍රධාන ආරාධිතයා ලෙස පැමිණියේ යුද හමුදාපති ලුතිනන් ජෙනරාල් ලසන්ත රුද්‍රිගු මහතාය.

විශේෂ බළකායේ පුහුණුව සුළුපටු එකක් නොවේ. මාස ගණනාවක පුහුණුවෙන් පසු විසිර යන සෙබළුන්ට විශේෂ බළකායේ උරහිස් ලාංඡනය පැලඳවීමට නියමිතව තිබුණේ මේ විසිර යන පෙළපාළියේදීය.

එම ලාංඡන ගුවනට ගෙන ගොස් ගුවනින් අඩි 80ක සිට කඹයක ආධාරයෙන් බිමට ගෙනැවිත් ඒවා යුද හමුදාපතිවරයාට ලබාදීමෙන් පසු යුද හමුදාපතිවරයා අතින් විසිර යන සෙබළුන්ට ලාංඡන පැලඳවීමට නියමිතව තිබිණි.

මේ කාර්යයට සූදානම්ව සිටි විශේෂ බළකා කාර්ය මණ්ඩලය දින තුනක් තිස්සේ ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ බෙල් 212 යානයෙන් මූලික පෙරහුරු තුනක් පවත්වා තිබිණි.

නවවැනි දින උදේ හිඟුරක්ගොඩ සිට පැමිණි බෙල් 212 යානය මාදුරුඔය හමුදා කඳවුරු වෙත පහත් කළේය. මේ නිදර්ශනය සඳහා සූදානම්ව සිටි හමුදා සෙබළුන් හතරදෙනෙක් සහ එයට සහාය වීමට තවත් සෙබළු දෙදෙනෙක් ද ගුවන් හමුදා හෙලිකොප්ටරයට ගොඩවිය.

කඹ දිගේ බිමට පැනීමට සිටි හතරදෙනා හෙලිකොප්ටර් යානයේ ඇති ආධාරකවලට තම කඹ රඳවා ගුවන්ගත වීම සිදුවිය. එම අවස්ථාවේ ගුවන් හමුදා නියමුවන් දෙදෙනා සහ ගුවන් හමුදා අවිකරුවන් දෙදෙනා සහ තවත් ගුවන් හමුදා සාමාජිකයන් දෙදෙනෙක් හෙලිකොප්ටරයේ සිටියහ. ඒ අනුව හෙලිකොප්ටරයේ ගමන් කළ මුළු සාමාජික සංඛ්‍යාව 12 දෙනෙකි.

තම දරුවන්ගේ විසිරයෑමේ පෙළපාළිය නැරඹීමට මවුපියන්ද විශාල පිරිසක් පැමිණ සිටියහ. සියලු කටයුතු සූදානම් කර තිබුණි. බෙල් 212 යානය ගුවන්ගත කිරීමට ෆ්ලයිං ලෙප්ටිනන්ට් ජයවර්ධන සහ ෆ්ලයිං ලෙප්ටිනන්ට් සිල්වා සූදානම් වූහ. මේ ගුවන්යානයේ කපිතාන් ලෙස කටයුතු කළේ ෆ්ලයිං ලෙප්ටිනන්ට් ජයවර්ධන මහතායි. මේ ගුවන් නියමුවන් දෙදෙනාම ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ සිටින දක්ෂ පළපුරුදු නියමුවන් දෙදෙනෙකි.

හමුදා නිදර්ශනයට බෙල් 212 ගුවන්යානය ගුවන්ගත විය. එම ගුවන්යානය ගුවනට නැංවීම සිදුවූයේ මාදුරුඔය ජලාශයට උඩින්ය. විසිර යෑමේ පෙළපාළිය නැරඹීමට පැමිණි පිරිස තව සුළු මොහොතකින් හමුදා සෙබළුන් උඩ සිට බිමට පැමිණෙන ආකාරය දැකගැනීමට යුහුසුලු වූහ. මේ මොහොත වන විට යුද හමුදා විශේෂ බළකායේ සෙබළු පිරිසක් මාදුරුඔය ජලාශයේ

## ආමි එකේ අයයි අපේ මාමාලා දෙන්නෙකුයි එකතු වෙලා හිටපු අය බේරා ගත්තා

### ප්‍රදේශවාසී මුදිත්



බෝට්ටු යොදාගෙන ආරක්ෂක සේවාවේ නිරතව සිටියහ. ඔවුන් එසේ ආරක්ෂක සේවාවේ නියැළුණේ එදින පැරෂුට් සංදර්ශනයක් පවත්වන බැවින් එයට සහභාගි වෙන පිරිස යම් හේතුවකින් වැව දෙසට ගොඩබෑමට සිදුවුවහොත් ඔවුන්ගේ ආරක්ෂාවටය.

මේ මොහොතේ පෙර දින රාත්‍රියේ ධීවර කර්මාන්තයේ නියැලුණු මාදුරුඔය ධීවර ගම්මානයේ ධීවරයෝ පිරිසක්ද ගොඩබිමට පැමිණෙමින් සිටියහ. කවුරුත් නොසිතූ මොහොතක හෙලිකොප්ටර් යානය වැව දෙසට පහත් වී ජලාශයේ සැඟව ගියේය.

ඒ අවස්ථාවේම විශේෂ බළකායේ භටයන් වහාම ක්‍රියාත්මක වී එම ස්ථානයට බෝට්ටු මඟින් ළංවී අනතුරට පත්වූ අය ගොඩගැනීම ආරම්භ කළහ.

**ඒ අවස්ථාවේ එම ස්ථානයට පැමිණි මාදුරුඔය ධීවර ගම්මානයේ සජිත් ප්‍රියන්ත මහතා තමන් දුටු දේ මෙසේ පැවසීය.**

''අපි මාළු අල්ලන්න ගියේ රෑ. මාළු අල්ලගෙන ආපහු එනකොට උදේ 8.30ට විතර ඇති. හමුදා කඳවුර පැත්තෙන් චොපර් එක උඩට ඉස්සුවා අපි දැක්කා. ඒ එක්කම වාගේ චොපර් එකේ මුහුණ ඉස්සරහට පහත් වෙලා වතුරේ වැදුණා. වතුරේ වදිනකොට චට පට ගාලා පෙති කැඩිලා ගියා අපි දැක්කා. පස්සේ අපි ඉක්මනින්ම ඔරු තුනක් අරගෙන එතැනට ගියා. අපි ගියාට පස්සේ හමුදාවේ මහත්තුරුත් ආවා. හමුදාවේ මහත්තරු කිවුවා 'මල්ලි අපි තුන්දෙනෙක් ගත්තා. දැන් චොපර් එක හොයාගන්න බැහැනේ' කියලා. පස්සේ අපිත් ටිකක් වතුර යටට ගිහින් බැලුවා. ඒ

## සෙබළුන් 6කට දිවි අහිමි කළ මාදුරුඔය ගුවන් අනතුර:

''අපි මාදුරුඔය ධීවර කර්මාන්තයට ගිහින් නැවත පැමිණෙන විට දැක්කා චොපර් එකක් උඩට උස්සනවා. ඒ එක්කම ඒක වතුරට පහත් වුණා. චොපර් එක යටට ගියා අපි ඉක්මනින් ඔරුව එතැන්ට ළං කළා. එතකොට හමුදාවේ අයත් ආවා. පස්සේ ඒකේ ඇතුළේ හිටපු අය ආමි එකේ අයයි', අපේ මාමාලා දෙන්නෙකුයි එකතුවෙලා අනතුරට පත් අය බේරගත්තා.

යුද හමුදා විශේෂ බළකායේ සෙබළු මහත් වෙහෙසක් දරා හෙලිකොප්ටර් යානයේ සිටි 12 දෙනාම රෝහල්ගත කිරීමට පියවර ගනු ලැබීය. ඉන් හයදෙනකුගේ ජීවිතය බේරා ගැනීමට හැකි වුවත් හයදෙනෙකු අවාසනාවන්ත ලෙස මිය ගියහ.

සැරයන් තුසිත වර්ණ, කෝප්‍රල් එච්.ඩී.පී. එන්.ප්‍රේමරත්න, කෝප්‍රල් එම්.එස්.එල්.පෙරේරා, කෝප්‍රල් ඩී.එම්.එච්.යූ. දසනායක යන හමුදා සෙබළුන් මියගොස් ඇති අතර ගුවන් හමුදාවේ සැරයන් ඩබ්ලිව්.එම්.එස්. උදය කුමාර, කෝප්‍රල් ආර්.එම්.එම්.මෙත්රුවන් යන දෙදෙනා මිය

## චොපර් එකේ මුහුණ පහත් වෙලා වතුරේ වදිනකොටම චට පට ගාලා පෙති කැඩිලා ගියා

### සිද්ධිය ඇසින් දුටු සජිත් ප්‍රියන්ත



බලද්දි චොපර් එකේ තෙල් වතුරේ උඩ පාවෙනවා දැක්කා. හමුදාවේ අයයි, අපි කට්ටියයි වතුරට බැස්සා. එතකොට තවත් දෙන්නෙක් ගන්න පුළුවන් වුණා. වතුරේ යට හෙලිකොප්ටරේ සිටි බෙල්ට් දාගෙන එක්කෙනෙක් ඉන්නවා අපි දැක්කා. එයාව අපි ඇද්දා. ඒත් ගන්න බැරිවුණා. පස්සේ ආපසු උඩට ඇවිත් පිහියක් අරගෙන ගිහින් බෙල්ට් එක කපලා එයාව එළියට ගත්තා. පස්සේ ලොකු බෑග් එකක් අපට හමුවුණා ඒකත් අරගෙන අපි ආවා. ඊට පස්සේ අපි නැවතත් ගොඩබිමට යන්න හදනවිට හමුදාවෙන් තවත් එක්කෙනෙක් ගොඩට ගත්තා. එකේ ඇතුළේ මොනවත්ම පේන්නේ නෑ. කළුම කළු පාටයි."

**මාදුරුඔය ගම්මානයේ ධීවර මුදිත් ෂෙහාන් මහතා මෙසේ පැවසීය.**

ගොස් තිබිණි.

දෙහිඅත්තකණ්ඩිය වැඩබලන මහේස්ත්‍රාත් යූ. රාජපක්ෂ මහතා විසින් මහේස්ත්‍රාත් පරීක්ෂණය සිදුකළ අතර ස්ථානීය පරීක්ෂාවෙන් පසු මේ මරණ සම්බන්ධව පශ්චාත් මරණ පරීක්ෂණය පවත්වන ලෙස පොලොන්නරුව මහ රෝහලේ අධිකරණ වෛද්‍ය නිලධාරියාට නියෝග කළේය. සිද්ධිය වූ දිනට පසුදින පොලොන්නරුව මහ රෝහලේදී අධිකරණ වෛද්‍ය නිලධාරි ආර්.එම්. එස්. බී. ගුණසේකර මහතා විසින් පශ්චාත් මරණ පරීක්ෂණය පවත්වනු ලැබීය.

මේ සිදුවීමෙන් පසු ශ්‍රී ලංකා ගුවන් හමුදාවට අයත් බෙල් 212 හෙලිකොප්ටර් යානය මාදුරුඔය ජලාශයෙන් ගොඩගැනීම ඉකුත් 10 වැනිදා කළ අතර, ශ්‍රී ලංකා නාවික හමුදාවේ කිමිදුම් අංශය මඟින් මේ හෙලිකොප්ටර් යානය ගොඩගැනීමට කටයුතු කළ බව නාවික හමුදාවේ මාධ්‍ය ප්‍රකාශක කමාන්ඩර් බුද්ධික සම්පත් මහතා පැවසීය.

ඉකුත් 10 වැනිදා නාවික හමුදාවේ කිමිදුම්කරුවන් විසින් මාදුරුඔය ජලාශයේ හෙලිකොප්ටර් යානය ඇති ස්ථානයේ කිමිදී යානය ගොඩගැනීමේ කටයුතු ආරම්භ කරනු ලැබීය. ජලය යට තිබූ යානය ජලාශයේ අයිනකට ගෙනඒමට කටයුතු කළ කිමිදුම්කරුවන් පසුව දොඹකරයක මාර්ගයෙන් හෙලිකොප්ටර් යානය ගොඩට ගත්තේය.

හෙලිකොප්ටර් යානය අනතුරට පත්වෙන අවස්ථාවේ ජලාශයේ විසිරී තිබූ කොටස් ද නාවික හමුදාවේ කිමිදුම් කණ්ඩායමේ නාවිකයන් විසින් ගොඩට ගත් අතර ඊයේ 11 දිනයේද හෙලිකොප්ටර් යානයේ ඉතිරි කැබලි සෙවීම නාවික හමුදාවේ කිමිදුම් කණ්ඩායම විසින් සිදු කරන බව ගුවන් හමුදාවේ මාධ්‍ය ප්‍රකාශක ගෲප් කපිතාන් එරන්ද ගිනිගේ මහතා පැවසීය.

ජලාශයෙන් ගොඩගත් හෙලිකොප්ටර් යානය ඊයේ (11) උදෑසන කටුනායක ගුවන්තොටුපොළේ ඉංජිනේරු අංශය වෙත ගෙනා බව ද සඳහන් කළේය. අනතුරට මුල්වූ කාරණා පිළිබඳව දැනට කිසිවක් ප්‍රකාශ කිරීමට නොහැකි අතර ගුවන් හමුදාපති එයාර් වයිස් මාර්ෂල් බන්දු එදිරිසිංහ මහතා පත් කළ කමිටුවේ වාර්තාව පැමිණි පසු එය ප්‍රකාශ කරන බව ද පැවසීය.

මේ හෙලිකොප්ටර් යානය ගොඩගැනීමේ කටයුතු සඳහා ශ්‍රී ලංකා නාවික හමුදාවේ සහායට ශ්‍රී ලංකා යුද හමුදාවේ විශේෂ බළකායේ සෙබළු ද, ගුවන් හමුදාවේ සෙබළුන්ද සහාය වූහ.

යානයෙන් වැවට කාන්දු වූ තෙල් ඉවත් කිරීම වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ නිලධාරීන් විසින් සිදුකරනු ලැබීය.

නැඟෙනහිර දිසාව භාර ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති වරුණ ජයසුන්දර මහතාගේ උපදෙස් පරිදි අම්පාර වැඩබලන කොට්ඨාස භාර පොලිස් අධිකාරි සනත් බණ්ඩාර මහතාගේ අධීක්ෂණය යටතේ මහඔය සහකාර පොලිස් අධිකාරි හේමන්ත සෙනෙවිරත්න මහතාගේ මෙහෙයවීමෙන් දෙහිඅත්තකණ්ඩිය පොලිස් ස්ථානාධිපති ප්‍රධාන පොලිස් පරීක්ෂක ගයාන් බුද්ධික කල්‍යාණරත්න, මහඔය පොලිස් ස්ථානාධිපති ප්‍රධාන පොලිස් පරීක්ෂක ධම්මික විජේසිංහ, පදියතලාව පොලිස් ස්ථානාධිපති පොලිස් පරීක්ෂක රොහාන් ගුණසේන මහත්වරු වැඩිදුර පරීක්ෂණ පවත්වති.

ගුවන් අනතුරින් මියගිය යුද හමුදා විශේෂ බළකා නිලධාරීන් සිවුදෙනාගේ සහ ගුවන් හමුදා නිලධාරීන් දෙදෙනාගේ මෘතදේහ මහේස්ත්‍රාත් පරීක්ෂණවලින් අනතුරුව, ඔවුන්ගේ ඥාතීන් වෙත භාරදීම පෙරේදා (10) සවස පොලොන්නරුව මහ රෝහලේ දී සිදුවිය.

ගුවන් අනතුරෙන් හමුදා නිලධාරීන් හයදෙනකු තවදුරටත් පොලොන්නරුව මහ රෝහලේ හදිසි ප්‍රතිකාර ඒකකයේ ප්‍රතිකාර ලබමින් සිටිති.

අනතුරෙන් තුවාල ලැබූවන්ගේ සුවදුක් විමසා බැලීමට යුද හමුදාපති ලුතිනන් ජෙනරාල් ලසන්ත රුද්‍රිගෝ මහතා ඇතුළු උසස් හමුදා නිලධාරීන් පිරිසක් රෝහලට පැමිණ සිටියහ. ප්‍රතිකාර ලබන සෙබළුන්ගේ සුවදුක් විමසීමෙන් අනතුරුව හමුදා සාමාජිකයන්ට අවශ්‍ය ඉදිරි ප්‍රතිකාර පිළිබඳ රෝහල් බලධාරීන් සමඟ යුද හමුදාපතිවරයා සාකච්ඡාවක් ද සිදු කළේය.

---

# මගේ නූපන් දරුවාට තාත්තා කෙනෙක් නැති වුණා

## සැරයන් තුසිතවර්ණගේ සයමස් ගැබිනි බිරිය හඬා වැටෙයි

බළන්ගොඩ සමූහ
සම්පත් ප්‍රියනන්දන

''අනේ මගේ දරුවට තාත්තා කෙනෙක් කොහෙන් ගෙනත් දෙන්න ද? දවස් තුනකින් නිවාඩු එනවා කියලත් කීවානේ! ඔහොම ගෙදර එනවා කියලා කිව්වේ නැහැනේ'රයැයි කියමින් මාදුරුඔය හෙලිකොප්ටර් අනතුරින් මියගිය විශේෂ බළකායේ සැරයන් තුසිතවර්ණ මහතාගේ නිසල දේහය බළන්ගොඩ නිවෙසට ඊයේ (11) රැගෙන ආ අවස්ථාවේදී සයමස් ගැබිනි බිරිය විලාප දෙමින් හඬා වැලපුණාය.

මාදුරුඔය හෙලිකොප්ටර් අනතුරින් මියගිය හයදෙනා අතර බළන්ගොඩ, ගුරුබැවිල ප්‍රදේශයේ පදිංචිව සිටි විශේෂ බළකායේ තුසිතවර්ණ මහතා ද අවාසනාවන්ත ලෙස මෙලෙස මියගියේය. තුසිතවර්ණ මහතා 2008 වසරේ විශේෂ බළකා පාඨමාලා අංක 38 යටතේ විශේෂ බළකා හමුදා සේවයට බැඳී ඇත. ඒ මහතා මාදුරුඔය විශේෂ බළකා පුහුණු කඳවුරේ උපදේශකවරයකු ලෙස සේවය කරමින් සිටියදී මේ හෙලිකොප්ටර් අනතුරින් ඉකුත්දා (09) අවාසනාවන්ත ලෙස මියගියේය.එදින පැවති විසිරයෑමේ පුහුණු පෙළපාළියේදී විසිර යන සෙබළුන් වෙත නිල ලාංඡන පිළිගැන්වීමේ රාජකාරියේ ඒ මහතා නිරත වී සිටි බව සහෝදර නිලධාරීහු පවසති. මේ අතර ඒ මහතා දක්ෂ උපදේශකවරයකු බව ද ඔවුහු වැඩිදුරටත් කීහ. සැරයන් තුසිතවර්ණ මහතා වසර 17ක කාලයක් විශේෂ බළකායේ රාජකාරි කර ඇති අතර තවත් වසර තුනකින් විශ්‍රාම යෑමට නියමිතව සිට තිබේ. මීට


තුසිතවර්ණගේ මංගල ජායාරූපය


බිරිය

වසර එකහමාරකට පෙර මාතර ප්‍රදේශයේ ගුරුවරියක සමඟ විවාහ වී ඇති අතර ඇය මේ වනවිට සයමස් ගැබිනියකි.

තම ආදරණීය සැමියා අවාසනාවන්ත ලෙස හැරයෑම ගැන හැඬූ කඳුළින් අදහස් දැක්වූ බිරිය මෙසේ ද පැවසුවාය.

''අපි විවාහ වෙලා දැනට වසර එකහමාරක් විතර වෙනවා.මගේ ගම මාතර. මම මාතර ප්‍රදේශයේ පාසලක සේවය කරනවා. මේ අනතුර වූ දිනයේ උදේ හතයි හතළිහට විතර මහත්තයා මට කෝල් එකක් අරන් පරිස්සමට ඉස්කෝලෙට යන්න කියලා කිව්වා. තව දවස් තුනකින් මම නිවාඩු එනවා. ඉවසගෙන ඉන්න. අපි බළන්ගොඩ ගෙදරටත් ගිහින් දන්සලුත් කාල එමු කියලත් කිව්වා. වැඩිය කතා කළේ නැහැ. මට පරක්කු වුණා මම යනවා කියලා ෆෝන් එක තිබ්බා. ඒ දවසේ දවල් වෙනකල් මට ආපසු කතා කළේ නැහැ. ඒත් මම හිතුවා එයා අමාරු රාජකාරි වැඩවලනේ ඉන්නේ. ඒක නිසා තමයි කෝල් එකක් ගන්නේ නැතිව ඇත්තේ කියලා.

එදා,දවල් පොඩි අයියා බැඳපු අක්කා මට කලබලෙන් වගේ කෝල් එකක් අරන් කීවා ළඟ ඉන්න මිස් කෙනෙකුට ෆෝන් එක දෙන්න කියලා.මම මිස් කෙනෙකුට ෆෝන් එක දුන්නා. ඒ මිස් කිව්වා මහත්තයාට පොඩි කරදරයක් රෝහල්ගත කළා කියලා. මම හිතුවා කුකුලක හරි ඩැමේජ් එකක් වෙලා වෙන්නැති කියලා. ඒත් හවස් වනවිට තමයි මම මේ සිද්ධිය දැනගත්තේ. අනේ මම මේ දරුවට තාත්තා කෙනෙක් කොහෙන් ගෙනත් දෙන්න ද? තව දවස් තුනකින් නිවාඩුවට ගෙදර එනවා කියලනේ මට කීවේ. මෙහෙම එනවා කියලා මට කිව්වේ නැහැනේ. මම මේ දුක කොහොමද දරාගෙන ඉන්නේ. සැරයන් තුසිතවර්ණ මහතාගේ පියා ද මීට වසර කිහිපයකට පෙර මියගොස් ඇති අතර සහෝදර සහෝරියන් සිවුදෙනකුගෙන් යුත් පවුලක බාල සහෝදරයා වූයේ ඔහුය.

---

# නිවාඩුවට අම්මලා බලන්න යමු කිව්ව මහත්තයා ගෙදර ආවේ පෙට්ටියෙන්

## සැරයන් සනත් උදය කුමාරගේ බිරිය හැඬූ කඳුළින් කියයි

වැලිමඩ සමූහ- කේ.ආර්.ආර්. රාජමන්ත්‍රි


බිරිය හඬා වැලපෙමින්

''සිංහල අලුත් අවුරුද්දට අපේ ගම්පොළ ගෙදර යන්න බැරිවුණු නිසා වෙසක් පෝයට ඇවිත් අපේ අම්මලා බලන්න යමු කියලා ගිය මගේ මහත්තයා වෙසක් පෝයට ගෙදර ආවේ මිනී පෙට්ටියකින්"යැයි කියමින් මියගිය ගුවන් හමුදා සැරයන් සනත් උදය කුමාර මහතාගේ බිරිය තම දරු දෙදෙනා තුරුළු කරගෙන හඬා වැලපුණාය.

ගුවන් හමුදාවට අයත් හිඟුරක්ගොඩ කඳවුරේ බෙල් 212 හෙලිකොප්ටර් යානය මාදුරුඔයට කඩා වැටී සිදු වූ අනතුරින් මියගිය හිඟුරක්ගොඩ මූලික කඳවුරේ අංක 07 හෙලිකොප්ටර් බලඝණයට අනුයුක්තව රාජකාරි කළ බලපන්ති සැරයන් ඩබ්ලිව්.ඇම්. සනත් උදය කුමාර (44) මහතාගේ බිරිය එසේ පැවසුවාය.

වැලිමඩ මහතැන්න දෙහිබැද්ද පදිංචි සිටි සැරයන් සනත් උදය කුමාර මහතාගේ අභාවය පිළිබඳව ප්‍රදේශයේ ජනතාව මහත් කම්පාවට පත්ව සිටිති. ගුවන් හමුදාවේ මැදිහත්වීමෙන් නිවසට රැගෙනවිත් තිබූ ඒ මහතාගේ දේහයට අවසන් ගෞරව දැක්වීමට ගුවන් හමුදාපති එයාර් මාර්ෂල් වී.බී. එදිරිසිංහ මහතා ද ඊයේ (11) සහභාගි විය. මියගිය සනත් කුමාර මහතාගේ බිරිය වන ආර්.ඇම්. නිලංකා කුමාරි මහත්මිය තම දරු දෙදෙනා තුරුළු කරගෙන මෙසේ ද පැවසුවාය.

''මම උපන්නේ ගම්පොළ. දැනට වසර 15කට කලින් අපි විවාහ වුණා. අපි දෙන්නට පිරිමි දරුවන් දෙදෙනකු සිටිනවා. සැමියා අපිත් එක්ක දිනකට කිහිප වතාවක්ම දුරකතනයෙන් කතා කර අපේ සැපදුක් අහනවා. අපේ දරුවන් දෙන්නට හොඳට උගන්නලා සමාජයට වැඩදායි අය කරන්නයි එයාගේ එකම බලාපොරොත්තුව තිබුණේ. එයා නිවාඩුවට ගෙදර ආවාම එයාගේ ලෝකේ අපි. එයා අපිව දාලා කොහේවත් යන්නේ නෑ. කොහේ ගියත් අපිවත් එක්කගෙන යනවා. එයා සිංහල අවුරුද්දට ගෙදර ආවේ එයාගේ අම්මටත් අපි හැමදෙනාටමත් තෑගි භෝග අරගෙන. අපි හැමෝම හැම නෑ ගෙදරකම ගියා. ඒත් අපිට මගේ අම්මා තාත්තා බලන්න යන්න කාලේ මදි වුණා. ඒ නිසා වෙසක් පෝය නිවාඩුවට ඇවිත් යමු කියලා එයා කිව්වා. එහෙම කියලා ගිය මගේ සැමියා වෙසක් පෝයට ගෙදර ආවේ පෙට්ටියෙන්.අපේ සියලු බලාපොරොත්තු ඉවරයි.''

මියගිය සැරයන් ඩබ්ලිව්.ඇම්. සනත් උදය කුමාර මහතාගේ මව වන ටී.ඇම්. කරුණාවතී මහත්මිය මෙසේ පැවසුවාය. ''අපේ දරුවන් 05 දෙනා අතරින් මියගිය සනත් පුතා පවුලේ දෙවැනියා. මගේ පුතා කුඩා කාලේ සිටම හැමෝම සමඟ ඉතාමත් සුහදශීලිවයි ඇසුරු කළේ. මිරහාවත්ත දේවානන්ද මහා විදුහලේ අධ්‍යාපන පොදු සහතික පත්‍ර උසස් පෙළ විභාගයට පෙනී සිට එම විභාගය සමත් වුණා.

පුතා පාසලේ ඉගෙනීමට අමතරව ක්‍රීඩා ඇතුළු බාහිර වැඩවලටත් සම්බන්ධව කටයුතු කළා.

උතුරේ යුද්ධය පැවති සමයේදී පුතා ගුවන් හමුදාවට බැඳෙන්න කැමති බව කීවා. සැමියා ද පුතාගේ කැමැත්තට ඉඩදෙන්න කීවා. පුතා 2004 අගෝස්තු මාසේ ගුවන් හමුදාවට බැඳුණා. දියතලාව ගුවන් හමුදා කඳවුරෙන් පුහුණුව ලබා යුද්ධය පැවති උතුරු පළාතේ පලාලි ඇතුළු ගුවන් හමුදා කඳවුරුවල සේවය කළා. හිඟුරක්ගොඩ ගුවන් හමුදා කඳවුරේ තමයි දිගු කලක් සේවය කළේ. පුතා මෙවර සිංහල අවුරුද්දට නිවාඩු අරගෙන අපේ නිවසට ආවේ තෑගි භෝගත් අරගෙන. පුතා අපිට කීවේ 2025 අගෝස්තු මාසේදි වසර 21 සේවයෙන් පසු විශ්‍රාම ගන්නවා. එතකොට ජීවිත කාලයම අපිත් සමඟ එකට ඉන්නවා කියලයි කීවේ. 9වැනිදා ගුවන් හමුදාවේ විසිරයෑමේ උත්සවයක් තිබෙන බව පුතා කීවා. මට 09 වැනිදා දහවල් රූපවාහිනී ප්‍රවෘත්තිවලින් ඇසුණා ගුවන් අනතුරක් සිදුවෙලා කියා. මම පුතාගේ ජංගම දුරකතනයට අවස්ථා 02 -03ක් ගත්තාට පිළිතුරක් ලැබුණේ නැති නිසා පුතාගේ නිවසට ඇවිත් දුවට ඒ බව කියා සොයා බලන්න කීවා. දුව සොයා බලා පුතා ගුවන් අනතුරකට ලක්ව ඇති බවට තොරතුරු ලැබුණා කියලා කිව්වා. දුව ඉක්මනින්ම පිටත්ව ගියා. කිසිවකුටත් කරදරයක් නැති අහිංසක ජීවිතයක් ගෙන ගිය පුතාගේ ජීවිතය හොරුගත්තා වගේ. මේ පොඩි දරුවන් දෙදෙනා සමඟ අපේ මුළු පවුලම අන්ත අසරණ වුණා".

අද (12)සවස් යාමයේ තම මිතුරන්ගේ උපහාර මැද ගුවන් හමුදා බලපන්ති සැරයන් ඩබ්ලිව්.ඇම්. සනත් උදයකුමාර මහතාගේ අවසන් කටයුතු සිදු කිරීමට නියමිතය.